# 3. කාර්ය මණ්ඩල පුවත්

1. 1977 වර්ෂයේදී අධිපති පහත සඳහන් සාකච්ඡා වලට සහභාගි විය.

    මැලේසියාවේ පැවති 12 වැනි සියසන් අධිපතිවරුන්ගේ සාකච්ඡා සමුළුව (ජනවාරි 11-23)

    කරච්චියේ පැවති ආසියානු නිශ්කාෂණ සංගමයේ අධ්‍යක්ෂ වරුන්ගේ රැස්වීම සහ ඉන්දියානු රිසව් බැංකුව සමග පැවති නිල සාකච්ඡා (පෙබරවාරි 7–15)

    තායිලන්තයේ චියැංමායි හි පැවති ආසියානු පලදවර්ධන සංවිධානයේ පාලක මණ්ඩලයේ 19 වැනි සැසි වාරය සහ සිංගප්පූරුවේ මූල්‍ය බලධාරී සමග නිල සාකච්ඡා (මැයි 14-24)

    ලන්ඩනයේ පැවති පොදු රාජ්‍ය මණ්ඩලීය මහ බැංකු අධිපතිවරුන්ගේ සාකච්ඡා සමුළුව සහ ස්විට්සර්ලන්තයේ බාසල්හි ජාත්‍යන්තර ණය බේරුම් කිරීමේ බැංකුවේ වාර්ෂික රැස්වීම. (ජූනි 1-21)

    වොෂිංටනයේ ජා. මු. අරමුදලේ සහ ජා. ප්‍ර. ස. බැංකුවේ වාර්ෂික රැස්වීම් සහ එංගලන්ත බැංකුව සහ ලන්ඩනයේ වාණිජ බැංකු සමග නිල සාකච්ඡා. (සැප්තැම්බර් 14—ඔක්තෝබර් 16)

    දකුණු කොරියාවේ සියොල්හි පැවති සියෙන්සා අධිපති වරුන්ගේ සංගමයේ 12 වැනි රැස්වීම (ඔක්තෝබර් 23—නොවැම්බර් 03)

2. මුදල් මණ්ඩලයේ පත් කළ සාමාජික එම්. රාජේන්ද්‍ර මහතා මුදල් මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් නිල හෙබවීම 1977 අගෝස්තු 11 වැනි දින සිට අවසන් විය.

3. 1977 අගෝස්තු මස 11 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එන්. ජී. පී. පණ්ඩිතරත්න මහතා මුදල් මණ්ඩලයේ පත් කළ සාමාජික වශයෙන් පත් කරනු ලැබීය.

4. මුදල් අමාත්‍යාංශයේ වැඩ බලන ලේකම් සී. චන්මුගම් මහතා, ආචාර්ය එල්. ආර්. ජයවර්ධන නොසිටි කාලසීමාවේදී මුදල් මණ්ඩලයේ නිල සාමාජික වශයෙන් කටයුතු කළේය.

5. ක්‍රම සම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ වැඩකටයුතු නැවත බෙදා වෙන් කිරීමත් සමග 1977 නොවැම්බර් 28 වැනි දින සිට ක්‍රම සම්පාදන සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් ආචාර්ය එච්. ඒ. ද එස්. ගුණසේකර මුදල් මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් නිල හෙබවීම අවසන් විය.

6. කේ. කනගසභාපති මහතා නිවාඩු පිට එතෙර ගොස් සිටියදී ඩී. ආර්. සිරිවර්ධන මහතා මුදල් මණ්ඩලයේ ලේකම් ලෙස වැඩ බැලීය.

7. නියෝජ්‍ය අධිපති ආචාර්ය ගාමණී කොරයා එක්සත් ජාතීන්ගේ වාණිජ, වෙළඳ සහ සංවර්ධන සමුළුවේ මහ ලේකම් වරයා වශයෙන් තවදුරටත් සේවයෙහි නිරත විය.

8. 1977 ජනවාරි 05 වැනි දින ක්‍රියාත්මක වන පරිදි ආචාර්ය ඩබ්ලිව්. එම්. තිලකරත්න ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ලෙස නිල නම් කරන ලදී. අධිපති තුමා එතෙර ගොස් සිටි කාලච්ඡේදයන් තුල ආචාර්ය තිලකරත්න, මුදල් නීති පනතේ 24 වැනි වගන්තිය යටතේ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කළේය.

9. නියෝජ්‍ය අධිපති ආචාර්ය ඩබ්ලිව්. රාසපුත්‍රම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි වෛකල්පික විධායක අධ්‍යක්ෂ වශයෙන් තවදුරටත් සේවයෙහි නිරත විය.

10. අධිපති තුමා සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති තුමා එතෙර ගොස් සිටි කාලච්ඡේදයන් තුළ මුදල් නීති පනතේ 24 වැනි වගන්තිය යටතේ නියෝජ්‍ය අධිපති එච්. එල්. ඩී. සෙල්වරත්නම් මහතා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ලෙස නිල නම් කරන ලද අතර, බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් කටයුතු කළේය. සෙල්වරත්නම් මහතා 1977 නොවැම්බර් 06 වැනි දින බැංකු සේවාවෙන් විශ්‍රාම ගියේය.

11. බැංකු පරිපාලන අධ්‍යක්ෂ ඩී. එල්. කන්නන්ගර මහතා, ගැම්බියාවේ මහබැංකු සේවයෙහි තවදුරටත් නිරත විය.

12. නාවික හා සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යාංශයට මුදහරින ලද පී. බී. කරඳවල මහතා 1977 නොවැම්බර් 01 වැනි දින සිට බැංකු සේවාවෙන් ඉල්ලා අස්විය.

13. අර්ධ කාලීන වශයෙන් රාජ්‍ය මැණික් සංස්ථාවට මුදහරින ලද ආයතන අධ්‍යක්ෂ ටී. ජී. පුංචිඅප්පුහාමි මහතා, රාජ්‍ය මැණික් සංස්ථාවේ සභාපති ලෙස 1977 ජනවාරි 01 වෙනි දින සිට පූර්ණකාලීන වශයෙන් මුදහරින ලදී.

14. විනිමය පාලක පී. සී. මුණසිංහ මහතා 1977 ඔක්තෝබර් 15 වැනි දින සිට බැංකු සේවයෙන් විශ්‍රාම ගියේය.

15. ලේකම්, ඒ. එස්. ජයවර්ධන මහතා, 1977 පෙබරවාරි 01 වැනි දින සිට ලංකා බැංකුවේ සාමාන්‍යාධිකාරී ලෙස මුදහරින ලද අතර, ඔහු 1977 දෙසැම්බර් 01 වැනි දින සිට ආපසු බැංකු සේවයට පැමිණියේය.

16. ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය විනිමය පාලක ඒ. ආර්. ප්‍රනාන්දු මහතා, 1977 මැයි 01 වැනි දින සිට අතිරේක විනිමය පාලක වශයෙන් පත් කරන ලදී.

17. නියෝජ්‍ය ලේකම් එස්. ඩබ්ලිව්. පී. අමරසූරිය මහතා, 1977 පෙබරවාරි 01 වැනි දින සිට වැඩ බලන ලේකම් වශයෙන් පත් කරන ලදී.

18. අර්ධකාලීන වශයෙන් මහා භාණ්ඩාගාරය වෙත මුදහරින ලද එස්. රාජලිංගම් මහතා 1977 සැප්තැම්බර් 08 වැනි දින සිට මුදල් අමාත්‍යාංශයට පූර්ණකාලීනව මුදහරින ලදී. රාජලිංගම් මහතා මුදල් අමාත්‍යාංශය වෙත මුදහරින ලද කාලය තුලදී ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලදී.

19. එස්. ඊස්පරදසන් මහතා සහ ආචාර්ය එල්. ඊ. එන්. ප්‍රනාන්දු අර්ධ කාලීන වශයෙන් මහා භාණ්ඩාගාරය වෙත තවදුරටත් මුදහරින ලදී.

20. දේශීය සහ විදේශීය වෙළඳ අමාත්‍යාංශයට මුදහරින ලද පී. එම්. හසන් මහතා, 1977 මාර්තු 15 වැනි දින සිට ආහාර හා සමුපකාර අමාත්‍යාංශයට මුදහරින ලදී.

21. 1977 අගෝස්තු 15 වැනි දින සිට සියැසන් පර්යේෂණ සහ පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ සහකාර අධ්‍යක්ෂ වශයෙන් සේවය කිරීම සඳහා ආචාර්ය එන්. ඊ. එච්. සඳරත්න හය මසක කාලසීමාවක් සඳහා මුදහරින ලදී.

22. 1977 ඔක්තෝබර් 03 වැනි දින සිට ලංකා ටයර් සංස්ථාවේ සභාපති ලෙස කටයුතු කිරීම සඳහා ඒ. ඒ. ඩී. ජස්ටින් මහතා කර්මාන්ත අමාත්‍යාංශය වෙත මුදාහරින ලදී.

23. 1977 පෙබරවාරි 01 වැනි දින සිට ඊ. එම්. ඩී. පීරිස් මහතා ධීවර අමාත්‍යාංශය වෙත මුදාහරින ලදී.

24. සමාලෝචනයට භාජනය වූ වසර තුළදී මහ බැංකුවේ පහත සඳහන් නිලධාරීන් රජය වෙත පූර්ණකාලීන වශයෙන් තවදුරටත් මුදාහරින ලදී.

| | | |
|---|---|---|
| ආචාර්ය පී. ඒ. එස්. දහනායක | – | ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු පිළිබඳ අමාත්‍යාංශය |
| ජී. එම්. පී. ඩී. ද සිල්වා මහතා | – | ලංකා සංවර්ධන මුදල් සංස්ථාව |
| එම්. බී. දිසානායක මහතා | – | මහා භාණ්ඩාගාරය |
| ආචාර්ය ටී. ඩබ්ලිව්. වයි. රණවීර | – | මහා භාණ්ඩාගාරය |